## මන්මුනෙයි දකුණ ඉරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මන්මුනෙයි දකුණ ඉරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ ඉරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1:3:1 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ රු.3,725,748 ක් විය.

### 1:3:2 අනුකූල නොවීම්

විගණනයේදී අනාවරණය වූ නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීත , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 396 | මාස 6 කට වැඩි කාලයක් ඉක්මවූ රු.8,730 ක් වූ උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳව පියවර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 572 | දීර්ඝ කාලයක සිට පැවති ඉකුත් තැන්පතු රු.1,205,240 ක් සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | නැගෙනහිර පළාත් මුදල් රීති අංක 174 | වගකිව යුතු නිලධාරියකුගේ සහතිකයකින් තොරව රු.7,775 ක මුදලක් විවිධ කාර්යයන් සඳහා ගෙවා තිබුණි. |
| (ඈ) | උතුරු නැගෙනහිර පළාත් විශේෂ ගැසට් නිවේදනය රීති 3 (1) | මාසික සභා රැස්වීම් වලට සහභාගි නොවූ මන්ත්‍රීවරුන්ට රු.5,000 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඉ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත | පාර්ශ්‍රමික වලින් රු.525 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. |
| (ඊ) | 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 1769 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව රු.237,445 ක් වූ සැලසුම් ඇදීම් ගාස්තු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට ගෙවා තිබුණි. |
| (උ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.9.1 | රු.711,150 ක් වටිනාකම වූ ප්‍රජා මධ්‍යස්ථාන 2 ක සිවිල් වැඩ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව ප්‍රදානය කර තිබුණි. |
| (ඌ) | උතුරු - නැගෙනහිර පළාතේ විශේෂ ගැසට් නිවේදනය - 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තියට සංශෝධනය | රෙගුලාසි වලට පටහැනිව සභාවේ මන්ත්‍රීවරුන්ට සංග්‍රහ වියදම් ලෙස රු.5,670 ක මුදලක් ගෙවා තිබුණි. |
| (එ) | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4.1 වගන්තිය හා IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය | සැලසුම් ඇදීම් ගාස්තු වලින් රු.30,645 ක මුදලක් අයකර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,314,274 ක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,291,202 ක් විය.

## 2:2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, සහ හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | *රු.000* | *රු.000* | *රු.000* | *රු.000* | *රු.000* | *රු.000* |
| (i) | වරිපනම් හා බදු | 66 | 66 | - | 15 | 15 | - |
| (ii) | බදු කුලී | 6,511 | 6,511 | 1,337 | 1,535 | 1,541 | 494 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 660 | 660 | 26 | 706 | 706 | 27 |
| (iv) | වෙනත් ආදායම් | 5,201 | 5,201 | - | 2,116 | 2,116 | 1,656 |

## 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| *පුනරාවර්තන වියදම* | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 18,534 | 3,715 | 14,819 | 17,610 | 15,620 | 1,990 |
| වෙනත් | 148 | 69 | 79 | 11,224 | 8,448 | 2,776 |
| උප එකතුව | 18,682 | 3,784 | 14,898 | 28,834 | 24,068 | 4,766 |
| මූලධන වියදම | - | 5,893 | (5,893) | 1,306 | 2,300 | (994) |
| මුළු එකතුව | 18,682 | 9,677 | 9,005 | 30,140 | 26,368 | 3,772 |

2:4 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය**

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | අනුමත | තථ්‍ය |
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 18 | 26 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 32 | 32 |
| වෙනත් (අනියම් / තාවකාලික) | - | 43 |
| | 51 | 102 |

2:5 **වත්කම් කළමනාකරණය**

2:5:1 **අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 4 කට වැඩි කාලයක් ඉක්ම වූ අයවියයුතු සේවක ණය ශේෂ එකතුව රු.334,167 ක් විය.

2:5:2 **අචල ජංගම වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ හතකට වැඩි කාලයක් ඉක්ම වූ චලනය නොවන තොග (පාවිච්චි නොකළ) වටිනාකම රු.48,216 ක් විය.

2:5:3 **සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම් වටිනාකම රු.19,592,582 ක් විය.

2.6 **බැංකු ගිණුම්**

(අ) බැංකු ගිණුම් දෙකක එකතුව රු.134,239 ක ශේෂයන් දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවතුණි.

(ආ) රු.38,196 ක් වූ අගරු චෙක්පත් 3 ක් පිළබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) රු.163,379 ක් වූ මුදල් වංචාව පිළිබඳව පියවර ගෙන නොතිබුණි.

2:7 **අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොම කෙරේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ආදායම් පරිපාලනය